




ගෙනාදි
සිපෙරෙව්

# ඇත්
# පැට්වා



ගෙනාදි
සිපෙරෙව්


# ඇත් පැටවා



ඒ කෝමත් එක රටක ඇත් පැටවෙක් හිටියා.

උෟ බොහොම හොඳ හුරතල් පැටියෙක්. කරන්න දෙයක් නැති හන්දා උෟ කනගාටු වුණා. ජනේලෙ ළඟ වාඩි වෙලා උෟ සුසුම් ලෑවා. කල්පනා කළා... වැස්සක් වහින්න පටන් ගත්තා.

"ඔහෝ, මේ ඇත් පැටියගෙ කන් දිහා බලපල්ලා, හරියට කුලු දෙකක් වගේ! වහින වෙලාවට ඔය කන් දෙක යටට වෙලා නොතෙමී ඉන්න පුළුවනි!" කියාල ඇත් පැටවා දුටු හිවල් පැටියෙක් කිව්වා.








වැහි වේලාවට කුඩයක් වගේ සතුන්ට උදව් වෙන්න පුළුවන් හන්දා ඇත් පැටියා සන්තෝස වුණා.

හිවල් පැටව්, හා පැටව් ඇත් පැටවාගේ කන් දෙකට මුවා වෙලා වැස්සෙන් බේරුණා.

වැස්ස නැවතුණා. ඇත් පැටවා නැවත් දුක් වුණා. කරන්න දෙයක් නැති හන්දා ඌ නැවත ජනේලය ළඟ වාඩි වෙලා කල්පනා කළා.




ගෙය අසළින් ගිය හා පැටියෙක් ඇත් පැටවාව දැක්කා.

"ඔයාගේ හොඬ බොහොම දිගයි, බොහොම ලස්සනයි. ඔයාට මල් ගස්වලට වතුර වත් කරන්න පුළුවනි." කියලා හා පැටියා කිව්වා.


ඇත් පැටවා සන්තෝස
වෙලා මල් ගස්වලට, තණ
පිටියට, පලතුරු ගස්වලට
වතුර වත් කළා.






වට පිට ඇති ගස්වලට වතුර වත්කළාට පස්සෙ කරන්න වැඩක් නැති හන්දා ඌ ආයෙමත් කනගාටු වුණා...

ඉරු බැස ගියා. අහසේ තරු දිලෙන්නට වුණා. රෑ වුණා.



ඉත්තෑ පැටව්, හිවල් පැටව්,
හා පැටව් නින්දට ගියා.






ඇත් පැටියා විතරක් නොනිදා කල්පනා කළා: මීළඟට මොනවද කරන්න ඕන?

හිටි හැටියේම ඌට ගිනි දැල්ලක් පෙනුණා! "ගිනි ඇවිලිලා!" කියලා ඇත් පැටවා හිතුවා. ඉක්මනට ඌ ගඟට දුවලා ගියා.

හොඬ ගඟට දමලා වතුර ගොඩාක් උරාගෙන ගින්නට අහුවෙලා ඇවිලුණු ගස් කොටයට ඉස්සා.






නිදා හිටිය පුංචි සත්තු නැගිටලා බැලුවා. ඇත් පැටවා ගිනි නිවා දැමූ හැටි දැකපු සත්තු ඌට බොහොම ස්තුති කළා. පැටව් එකතු වෙලා, කැලෑවෙ ගිනි නිවන්නා හැටියට ඇත් පැටවාව පත් කළා.



දැන් ඉතින් ඇත් පැටවා බොහොම ආඩම්බරයි. රන්වන් පාටැති තොප්පියක් හිසේ පැළඳගෙන ඇත් පැටියා කැලෑව රකිනවා. ගිනි ඇවිලෙන තැන් හොයා බලනවා.

රන්වන් පාට හිස්වැස්මට වතුර පුරවලා කඩදාසි බෝට්ටු පා කරන්න හා පැටියයි, හිවල් පැටියයි හරි ආසයි. ඇත් පැටියා උන්ට එහෙම කරන්න ඉඩ දෙනවා.



**ඇත් පැටවා**

**ගෙනාදි සිපෙරෙව්**

පරිවර්තනය
**දූදිගම වී. රුද්රිගු**

චිත්‍ර
**සෙබ්රෝවා**

නව සකැසුම
**මාලක ලලනජීව**

ISBN 978-955-1979-28-7

ප්‍රකාශනය
**කැනොල් පබ්ලිෂිං හවුස්**

මුද්‍රණය
**රොනැට් එන්ටප්‍රයිසස්**

**මුද්‍රණය 2012**

ගෙනාදි
සිපෙරෙව්

# ඇත් පැටවා




**Kanol Publishing House**
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-28-7
Rs. 125/-
9 789551 979287